

## වියරු වැටුණට එක් නිමේශෙක

### ආශා ඩී පෙරේරා

නාය නොගියට මතු පිටින්
දෝරෙ ගිය දුක හිත යටින්
දරාගෙන අපි උන්නු හැටි ගැන
දන්නෙ නෑ ඔය පින්වතුන්

අඩි හයයි හයෙ කාමරේ
දවස ගෙව්වෙම හාමතේ
කාපු හැටි අහගන්ට තිබුණා
ගලක්වත් තිබ්බා නම් ලිපේ

භූමිතෙල් කදුලක් නැතී
ලාම්පුව තවමත් ඇතී
මාස හතරේ පොඩි එකාටත්
තිබුණෙ නෑ ළය කිරි එරී

උපන්දා ඉඳ ජීවිතේ
වින්දෙ අපමණ දුක් පොදී
හුස්ම වැටෙනා මළ කදන් වගෙ
අපි උන්නෙ සතුටට හිරි වැටී

ගැහෙන තුරු හදවත් ළයේ
උන්නෙ හැමටම පණ වගේ
වියරු වැටුණට එක් නිමේශෙක
මක් කොරන්ටද ස්වාමිනේ...!

මේ මහා කඳු හිස පවා
සැළෙන්නැති අපෙ දුක බලා
සත්තකයි මහතුනේ පින්වත්
කන්ද අප හට පෙම්කලා.






## අන්ධ ළමයා

සුදෝ සුදු කාව්‍ය
සංග්‍රහයෙන්

කේයස්
(සාගර පලන්සූරිය)

මල් ලස්සනයි හොඳ හොඳ පාටයි කීවා
පෙනෙනවා දකිනවා කියනා ඒවා
මොනවද අම්මෙ මම අහගන්නට ආවා
තෝරා දෙන්න මම දන්නේ නෑ මේවා

මල්වල හොඳ සුවඳ මිස පාටක් කොහෙද
ඒවා මොළොක් බව තේරෙනවා මටද
එළියක් කියා මොකවත් හෙම තියෙනවද
මට තේරුම් ගන්ට අම්මේ බැරි මොකද

උණුසුම දැනේ දහවල මට රැයට වඩා
වෙනසක් හෙම තියෙනවද මෙහි මෙයට වඩා
මට නොදැනෙන්නෙ මා කණ කොලුවෙකිලු කුඩා
ලොකු වෙන කොට දැනේවිද මම අසමි හඬා

ඇඟිලි තුඩට මල් පෙති වල ඇති මෙළෙක
මට දැනෙනවා එය අල්ලන හැම විටෙක
පාට කියා ඇත්නම් ගතියක් මලෙක
අම්මේ අත නොගෑවෙන එක තමයි දුක

ලස්සන කියන දේ නැහැයට වත් කනට
මගේ දිවට හරි මගෙ අත පය වලට
නොදැනෙන්නේ මොකද තෝරා දෙන කලට
ඉවසා ගෙන ඉන්න අම්මේ බැරිය මට

ඇයි අම්මේ අඬන්නේ මේ කඳුලු සලා
මට දැනෙනවා යයි මගෙ අත් දිගට ගලා
නාඩන් අම්මෙ නාඩන් මම විහිළු කළා
එන්නද ගොසින් බොරු කී කොල්ලන්ට තලා

*සිත්තම- කුමුදු තාරක*

## වැසි වසන ඒ කඳුළු

### අතුල විජේවික්‍රම

අහස් තලයේ වළා විසිරිලා පිරෙන්නේ
කැටි ගැසුණු ඒ හෙලන කඳුලින්ද

මේ චණ්ඩ මාරුතය වී ගලා හමන්නේ
පොදි ගැසුනු හද පෙලන සුසුමෙන්ද

අකුණු විදුලිය කොටා පුපුරලා දැවෙන්නේ
තෙරපෙනා වේදනා ගොඩකින්ද

මල් එල පිරී ලොවක් ජීවිතය ලබන්නේ
වැසි වසන ඒ කඳුළු බිඳකින්ද

## අතීතය අමරණීයයි

### නන්ද ගුණවර්ධන ගුරු මාතා

මවින්ට් වේටලි

ගුවන් ගැබේ ක්ෂිතිජය වෙත
වහා දිවුනි මගේ දෙනෙත
අවට අඳුර පුරවාගෙන
පැතුරුණි කළු වලාකුලක්

හදවත වෙත ලං වෙන්නට
කිසිවෙක් මා අසල නොමැත
දෙසවනට ගැටුණි මගෙ
කුරිරු දුම්රියේ රළු හඬ

පෙනෙන තෙක් මානයේ
මිනිස් පුළුටක් නොමැත
දෙදරන මගෙ හදවතට
කුරිරු වන්නේ ඇයිද දෛවය

කැදලි කරා පියඹා යන
සියොතුන්ගේ නාදයෙන්ද
අවුල් වෙනව මගේ මනස
සැනසීමක් නැත මා හට

වසර ගණනාවකට පෙර
අපේ හදවත් බෙදු ගත්තා
සතුට මිහිර හා සාමය
ආදරයෙන් රැක ගත්තා

අහිංසක ආදරය අපගේ
දෛවය උදුරා ගත්තා
ආදර පිය තුමාගෙ අණ
රැකිය යුතුය මට සිතුනා

එඩිතර කීකරු දියණී
හදවත ගොළු කරගත්තා
පියතුමාගෙ අණසක වෙත
මගේ හදවත නැමිගියා

මගෙ හදවත වැලපුනා
සැනසිල්ලද නිමවුනා
නැවුම් පෙමේ පිවිතුරු බව
නිමාවකට පත් වුනා

මනස වියරු වුනත් මගේ
මගේ සතුට ඔබෙ සතුටයි
පිවිතුරු හදවතින් ඔබේ
මගේ නාමය මකාලන්න

බාධාවක් නොකරමි මම
දුරු රටකට පියාහඹමි
මගේ නෙතට නොගැටී සිට
ඔබ සුව දුක් සොයා බලමි

මගේ හදට ඇතුල් වෙන්න
කිසිවෙක් ලොව ඉපදී නැහැ
'සඳ' නමැති නම සුරකිමි
මැණික රකින නාගයා මෙන්

සඳ නොමියන 'සඳ' නාමය
අහිමි වුනමුත් මෙ භවයේ
ලබා ගන්න මතු භවයේදී
දහම අනුව පෙරුම් පුරමි

අවසන් ආදර හසුනේ
මෙසේ ලියා එව්ව නමුත්
ඒ ගැන දැන ගන්නා විට
දස වසරක් ගෙවී ගොසින්

පිවිතුරු පෙම යට ගියා
කීකරු කම මතු වුනා
හැදියාවත් සිහල කමත්
හදවත් තුල පැතුරුණා

## මුණුපුරු පැටියාට උපන්දින ආසිරි

### ගුණසීලි ජයසුන්දර

මිණි කිරුළක් පැළඳ රජවිය මගේ පුතා
රජ බිසවක් වුණා මව ලේ සුදුව යතා
මිත්තණියක් විලස සහසක් පැතුම් ඔතා
සෙත් පිරිතක් ගයමි තෙරුවන් පිහිට පතා

අනුහස් ඇත උතුම් මුණි දිනු මැයි මාසේ
හඳ රැස් පැළට එබුණා ඔබ දිනු දවසේ
වස්දොස් නැත ඔබයි පුත රන් හඳ නිවසේ
සියවස් ආයු බෝ වේ නැණ බල එකසේ

ලස්සන ඇස් දෙකක් ඇති අපෙ සුනෙත් පුතා
වස්සන හිනා වැස්සෙන් හද පිනා යතා
දිස්වන ළපටි මුව සුරතල් වදන් ඇතා
දිස්වන මගේ වියපත් බව මැකී යතා

විදේසයට මං ආවේ නුඹ හින්දා
හිතේ දුකට මට කවි කියවුණ හින්දා
මගේ රටට යන දා නුඹ මෙහි රන්දා
හිතේ ලෙඩට ඔහු ලොව ඇත්දෝ මන්දා

නැතියෝ දෙන්ට රන් කහවණු සිතු සැටියා
බැරියෝ සඟවන්න දරු පෙම ලොව සැටියා
පැටියෝ පෙනෙයි පරපුර පවතින සැටියා
දෙවියෝ රැක දෙන්න මගේ මුණුපුරු පැටියා

## අපිත් පදිමු රං ඕංචිල්ලා



අවුරුදු ක්‍රීඩා අතර ඕංචිල්ලාවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. අද මෙන් නොව එකල නම් ගමින් ගම කතුරු ඕංචිල්ලා බැදිනි. කතුරු ඕංචිල්ලා බඳින්නේ ආවාට ගියාට නොව. මෙය දෙවියන්ගේ ක්‍රීඩාවකි. එනිසා කතුරු ඕංචිල්ලාව බැඳීමට පෙර මෙන්ම ගැලවීමෙන් පසු ද දෙවියන් උදෙසා යම් යම් පුද පූජා පවත්වන්නේය.

මිතුරු මෙනුඹ අප එක්ව සියල්ලා
කතුරු ලෙසට බැඳ රන් ඕංචිල්ලා
නතරලමින් ගුවනේ ඕංචිල්ලා
මෙවර පදිමු අපි රට ඕංචිල්ලා

තටුව උඩින් සිට බැඳ ඕංචිල්ලා
පිට පිට පෑගුව එකර කැචිල්ලා
වට පිට සිටි අය බලා සිටිල්ලා
අට දෙන අට තොට වාඩි වෙයල්ලා

උඩම උඩ වැඩ මක්කම වැල්ලේ
වසින වසින වැසි ඒ ගල පල්ලේ
දුවන දුවන නැව් සමුදුර එල්ලේ
අපිත් පදිමු දැන් රං ඕංචිල්ලේ

අට දෙන අට කොන වාඩි වෙයල්ලා
සිට ගෙන දෙන්නෙක් පොලු පාගල්ලා
වවුලන් ලෙස කැරකෙන ඕංචිල්ලා
අපිත් පදිමු දැන් රං ඕංචිල්ලා

පදින කලට අඟනෝ ඕංචිල්ලා
අදින සළුව තද කර ඇඳගල්ලා
තදින අතින් වැල අල්ලා ගල්ලා
සොඳින වරල බැඳ ගෙන පැදපල්ලා

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com